හිතවත් ඉනර් සර්කල් සාමාජිකයන් වෙත,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති පාරිභෝගික පඥප්තියට අනුව යමින්, ඔබගේ පහසුව උදෙසා අපගේ බැංකු පහසුකම් හා සේවා පිළිබඳ, මූලික තොරතුරු අඩංගු ලේඛන මාලාවක් අප විසින් සකස් කර ඇත. ඔබගේ අවශ්‍යතාවය පරිදි ඔබට සරිලන බැංකු පහසුකම් හා සේවා තෝරාගැනීමට එම ලේඛන මාලාව ඔබට පහසුවක් වනු ඇත.

මෙම මූලික තොරතුර අඩංගු ලේඛනය තුළ පුද්ගලික බැංකු කටයුතුවල නිරත වන ඉනර් සර්කල් සාමාජිකයන් සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පිරිනමන විශේෂ වරප්‍රසාද පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් අඩංගු වෙයි.

එසේ වුවද, මෙම මූලික තොරතුරු අඩංගු ලේඛනයේ දක්වා ඇති කරුණු, නෛතික හා නියාමන වෙනස් වීම් මත මෙන්ම බැංකුවේ ප්‍රතිපත්ති හා කාර්යපටිපාටින්හි සිදු කරන වෙනස් කිරීම් මත සංශෝධනය විය යුතු බව කරුණාවෙන් සළකන්න.

ඔබට මේ පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම්, www.nationstrust.com අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න. 011 4 626 262 අංකය ඔස්සේ පැය 24 පුරාම ක්‍රියාත්මක අපගේ ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වන්න. නැතහොත් innercircle@nationstrust.com ලිපිනයට ඊමේල් පණිවුඩයක් එවන්න.

එසේම පහත සඳහන් ප්‍රතිලාභ පිළිබඳ ඔබට යම් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඇත්නම්, එම පැමිණිල්ල කෙටියෙන් සඳහන් කර,

පැමිණිලි විසඳීමේ නිළධාරී, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02 ලිපියනට යොමු කරන්න. නැතහොත් 011 4 626 262 අංකයෙන් අප ඇමතීමෙන් හෝ customerservice@nationstrust.com ලිපිනයට එම පැමිණිල්ල යොමු කිරීමෙන් අපව දැනුවත් කරන්න. බැංකුව විසින් ඔබට ක්ෂණික ප්‍රතිචාර දක්වනු ඇත.

## ඉනර් සර්කල් - විශේෂ වරප්‍රසාද පිළිබඳ මූලික තොරතුරු

| සාමාජිකත්වය පිළිබඳ විස්තරය | පාරිභෝගිකයාට හිමි ප්‍රතිලාභ | ගාස්තු වර්ග හා අනෙකුත් බැංකු අයකිරීම් | ගිණුමක් විවෘත කිරීමට අනුගමනය කළ යුතු පියවර | ප්‍රධාන නියමයන් හා කොන්දේසි |
| --- | --- | --- | --- | --- |
| **ඉනර් සර්කල් සාමාජිකත්වය**<br><br>ඔබ වෙනුවෙන් පුද්ගලිකවම කැපවෙමින් ඉතා ඉහළ සේවාවක් හා විශේෂ අවධානයක් ලබාදෙමින් කාලය ඉතුරු කරන ඩිජිටල් සේවා, විවිධ මූල්‍ය වරප්‍රසාද, ආයෝජන අවස්ථා හා තවත් වරප්‍රසාද ඇතුළත් සුවිශේෂ සබැඳියාවකින් යුතු සාමාජිකත්වයකි. | • ඔබත් සමඟ සෘජු සම්බන්ධතා පවත්වා ගනිමින් ඔබ වෙනුවෙන් පුද්ගලිකවම කැපවී සේවය කිරීමට හැකි පරිදි බැංකුවේ විශේෂයෙන් වෙන් කරන ලද පරිශ්‍රයක් තුළ වෙනමම බැංකු නියෝජිතයෙකු සිටීම.<br>• වැටුප් රක්ෂණය* - හදිසි වියෝවකදී රු. 1,200,000ක උපරිමයක් දක්වා ඔබගේ වැටුප මෙන් 6 ගුණයක රක්ෂණාවරණයක් පිරිනැමේ.<br>• සෞඛ්‍යරක්ෂණාවරණය* - බරපතල රෝග 36ක් සඳහා රු. 100,000ක ආවරණයක්. පළමු වසර තුළ නොමිලේ වෛද්‍ය පරීයේෂණයක් හා අනෙකුත් පරීයේෂණ සඳහා 15% ක වට්ටමක්. කොළඹ නගරයේ සිට කි.මී 20ක් ඇතුළත ඔබේ නිවසටම නොමිලේ ඖෂධ ගෙනවිත් දීමේ පහසුකම.<br>• තැන්පතු, ණය හා බැංකු අයිරා සඳහා සුවිශේෂ පොලී අනුපාත.<br>• Lankapay සමඟ ජාලගත 3500කට වැඩි ATM යන්ත්‍ර වෙතින් මසකට 3 වරක් ගාස්තු රහිතව මුදල් ආපසු ලබාගැනීමේ හැකියාව. රු. 200,000ක් දක්වා එක් දිනක් තුළදී ATM යන්ත්‍ර වෙතින් මුදල් ආපහසු ලබාගැනීමේ හැකියාව. රු. 150,000ක් දක්වා වූ දෛනික POS සීමාව.<br>• ක්‍රෙඩිට් කාඩ්පත් - සම්බන්ධ වීමේ ගාස්තු රහිත හා පළමු වසර සඳහා වාර්ෂික ගාස්තුවෙන් නිදහස් ඇමෙරිකන් එක්ස්ප්‍රස් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පතක් හා ප්ලැටිනම් | • සම්බන්ධවීමේ ගාස්තු රහිතයි.<br>• වාර්ෂික ගාස්තු රහිතයි.<br>• මාසික ගාස්තු රහිතයි.<br>• ලියකිවිලි ගාස්තු රහිතයි.<br>• අවම වැටුප් නිර්ණායකය මත මාසික වැටුප ප්‍රේශනය නොකරන ගනුදෙනුකරුවන්ගෙන් මාසිකව රු. 1500ක ගාස්තුවක් අයකෙරේ.<br>• අවශ්‍ය අවම ශේෂයට අනුව පත්වාගෙන නොයන තැන්පතු සඳහා කැලැන්ඩර මාසයක් සඳහා රු. 1500ක ගාස්තුවක් අයකෙරේ.<br>• පෙර තීරුවේ "ප්‍රතිලාභ" යටතේ සඳහන් ව්‍යතිරේක වලට යටත්ව බැංකුව විසින් සාමාන්‍යයෙන් අයකරන ගාස්තු හා වෙනත් ගාස්තු අදාළ වේ. | • පොදු ව්‍යාපාර නියමයන්, එම්.අයි.එස් ෆෝරමය, ලිපිනය සනාථ කිරීමේ ෆෝරමය, අත්සන තහවුරු කිරීමේ කාඩ්පත, නේෂන්ස් සැලරි සේවර් ගිණුම සඳහා අවශ්‍ය වැටුප් පත්‍රිකා යනාදිය අන්තර්ජාලය ඔස්සේ සම්පූර්ණ කිරීමෙන් හා ලබාදීමෙන් ජංගම හා ඉතුරුම් ගිණුම් "ALPHA" ඩිජිටල් ක්‍රමවේදය ඔස්සේ ඕනෑම තැනක සිට විවෘත කරගත හැක.<br>• අවශ්‍ය සියලුම ලියකියවිලි සම්පූර්ණ කර ඩිජිටල් ක්‍රමවේදය ඔස්සේ ජංගම හා ඉතුරුම් ගිණුම් විවෘත කර ඇති බැවින් දැනට සිටින සියලුම පාරිභෝගිකයන් සඳහා සම්මත ගිණුම් විවෘත කිරීමේ ක්‍රමය ඔස්සේ ස්ථාවර තැන්පතු ඇරඹිය හැක.<br>• සමාගමේ රබර් මුද්‍රාව තබා සේවා යෝජකයා විසින් වැටුප් පත්‍රිකාව සහතික කළ යුතුය.<br>• වලංගු ජාතික හැඳුනුම්පතේ පිටපතක් හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් අවශ්‍ය වේ.<br>• නේවාසික ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයෙන් වෙනස් වන්නේ නම් එය තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍යවේ.<br>• ලබාදී ඇති ස්ථිර ලිපිනය තහවුරු කිරීම සඳහා උපයෝගීතා බිල්පතක් (ජල/විදුලි බිල්පත්)/බැංකු ප්‍රකාශයක්/වරිපනම් රිසිට් පතක්/පොදු අධිකාරියකින් ලබාගත් ලිපියක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ (ආසන්නතම මාස 3 ඇතුළත වීම අවශ්‍ය වේ).<br>• අයදුම්කරු ඊටීඑෆ්/ඊපීඑෆ් අරමුදල්වලට දායක නොවන අයෙකු නම්, ඔහු/ඇය පූර්ණකාලීන සේවයේ නියුතු සුදුසුකම්ලත් වෘත්තිකයෙකු විය යුතුය. CIMA, ACCA, CIM, IESL, ගෘහ නිර්මාණ ශිල්පි , ICA, CFA, වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබිය යුතුය.<br>• ඉනර් සර්කල් සාමාජිකත්වය පිළිගැනීමේ අයදුම්පත අවශ්‍යවේ. | • වලංගු ජාතික හැඳුනුම්පතක්/විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18 ඉක්ම වූ නේවාසික/අනේවාසික ශ්‍රී ලාංකිකයෙක් විය යුතුයි.<br>• විදේශිකයෙකු නම් වලංගු වීසා බලපත්‍රයක් තිබිය යුතුයි.<br><br>**සුදුසුකම්**<br><br>• නේෂන්ස් සැලරි සේවර් (NSS) ගිණුමකට රු.200,000ක අවම ශුද්ධ මාසික වැටුප එකවර බැරකිරීමක් ලෙස ප්‍රේෂණය කිරීම. එම මාසයේදීම, සනාථ කිරීමක් සහිතව ස්ථාවර දීමනා ප්‍රේෂණය කිරීම සළකා බලයි. විද්‍යුත් බැංකු ප්‍රකාශ හා මොබයිල් බෑන්කින් සඳහා ලියාපදිංචිවීම අනිවාර්යවේ.<br>• ස්ථාවර තැන්පතු ගිණුමක රු. මිලියන 2ක් හෝ ඊට වැඩි මුදලක් පවත්වාගැනීම සහ ඉතුරුම් ගිණුමක හෝ ජංගම ගිණුමක අවම මාසික බැර ශේෂ සාමාන්‍යය, රු.10,000ක් පවත්වාගැනීම. විද්‍යුත් බැංකු ප්‍රකාශ හා මොබයිල් බෑන්කින් සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය වේ.<br>• ස්ථාවර තැන්පතු ඉතුරුම් හෝ ජංගම ගිණුමක /ගිණුම්වල රු. මිලියන 2ක තැන්පතු සබඳතාවක් පවත්වාගැනීම (එක ගිණුමක හෝ ගිණුම් කිහිපයක එකතුව ලෙස) සමග ඉතුරුම් ගිණුමක අවම මාසික බැර ශේෂ සාමාන්‍යය, රු.10,000ක් පවත්වාගැනීම. විද්‍යුත් බැංකු ප්‍රකාශ හා මොබයිල් බෑන්කින් සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය වේ.<br>• නේෂන්ස් සැලරි සේවර් ගිණුමට පහත ආකාරයෙන් මුදල් බැර කළ හැකිය. ස්ලිප් මඟින්/එළඹෙන දින 30ක් ඇතුළත වෙනත් බැංකු ගිණුමක් වෙතින් ස්ථාවර නියෝගයක් මඟින් 'කළමනාකරු, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව (ගිණුම් හිමියාගේ නම)' ට යොමු කරන චෙක්පතක් ගිණුමට හුවමාරු කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පතක්.<br>• පුද්ගල හා වාහන ණය - ප්‍රකාශිත අගයෙන් 0.5%ක් පොලී අනුපාතය අඩු කළ, සැකසුම් ගාස්තුවෙන් 10% නිදහස් කළ ඔබගේ දළ වැටුප මෙන් 15 ගුණයක් දක්වා වූ ණයක්.<br>• සම්බන්ධ වීමේ ගාස්තු රහිත හා පළමු වසර සඳහා වාර්ෂික ගාස්තුවෙන් නිදහස් නේෂන්ස් ෂොපිං ඩෙබිට් කාඩ්පතක්.<br>• ඩිජිටල් බැංකුකරණ පහසුකම් - අන්තර්ජාල බැංකුකරණ හා මොබයිල් බැංකුකරණ පහසුකම.<br>• හුවමාරු කරන ලද මුදලේ අගය නොසළකා හැර බැංකු පත්‍රිකා මඟින් සිදුකරන එක් මුදල් හුවමාරුවක් සඳහා රු. 50ක සැකසුම් ගාස්තුව.<br>• අභ්‍යන්තර ප්‍රේශන (විදේශයක සිට මුදල් එවීම) - සම්මත කොමිස් මුදලෙන් 50%ක වට්ටමක්.<br>• ඉනර් සර්කල් සන්නාමය සහිත චෙක් පොතක්. | | | මගින්.<br>• නේෂන්ස් සැලරි සේවර් ගිණුමට අඛණ්ඩව මාස 3ක් වැටුප බැර නොවූ විටකදී නේෂන්ස් සැලරි සේවර් ගිණුමට හිමි ප්‍රතිලාභ නොලැබේ. |

*වැටුප් රක්ෂණය සහ **සෞඛ්‍ය රක්ෂණය - 2020 බැංකු සංශෝධනයට අනුව අවමය රු. 100,000ක මුදලක් හෝ 2018 බැංකු සංශෝධනයට අනුව රු. 75,000ක් හෝ ඊට වැඩි මුදලක් මාසිකව තනි බැර කිරීමක් වශයෙන් නේෂන්ස් සැලරි සේවර් ගිණුමකට ප්‍රේෂණය කරන නේෂන්ස් සැලරි සේවර් බැංකු ගිණුම්හිමියන් මෙම රක්ෂණ පහසුකමට සුදුසුකම් ලබන අතර එම රක්ෂණය සොෆ්ට්ලොජික් ඉන්ෂුවරන්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින් පිරිනමනු ලැබේ.